# උත්ථාන සමයේ දෙවන සතිය
# බදාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි. ක්‍රියා 5 : 17–26

**ඔබ සිරගෙයි දැමූ අය දේව මාළිගයේ සිට ජනයාට උගන්වති.**

එවිට උත්තම පූජකයා සහ එහි සිටි සද්දුසි පක්ෂයේ අය ඊර්ෂ්‍යාවෙන් පිරී නැඟී සිට අපෝස්තුළුවරුන් අල්ලා පොදු සිරගෙයි දැමූහ. එහෙත් රාත්‍රියේ දී ස්වාමින් වහන්සේගේ දූතයෙක් සිරගෙයි දොරවල් ඇර ඔවුන් පිටත ගෙන ගොස්, ඔවුන්ට කතා කොට "යන්න, දේව මාළිගාවේ සිට මේ ජීවන මඟ පිළිබඳව සියලු දේ සෙනඟට ප්‍රකාශ කරන්නැ"යි කීය. ඔව්හු ඒ අසා අලුයම දේව මාළිගාවට පිවිස ඉගැන්වූහ. ඒ අතර උත්තම පූජකයා ද පිරිවර ද පැමිණ මුළු ඉශ්රායෙල් උත්තර මණ්ඩලය ඇතුළු මන්ත්‍රණ සභාව රැස් කරවා අපෝස්තුළුවරුන් ගෙනෙන පිණිස හිරගෙදරට නියෝගයක් යැවූහ. එහෙත් මුර සේවකයෝ ගොස් සිරගෙයි ඔවුන් සිටිනු නොදැක ආපසු පැමිණ මෙසේ සැළ කළහ. "සිරගෙය ඉතා සුරක්ෂිත ලෙස වසා තිබුණි. මුරකරුවන් දොරටු ළඟ සිටි බව ද දුටිමු. එහෙත් දොර ඇරිය කළ ඇතුළේ කිසිවෙක් අපට හමු නොවූහ."

දේව මාළිගාවේ සේනාධිපතියා ද නායක පූජකයෝ ද මේ පුවත අසා කුමකින් කුමක් වේදැ යි වික්ෂිප්ත වූහ. එවිට මිනිසෙක් අවුත් "අන්න ඔබ හිරගෙයි දැමූ අය දේව මාළිගාවේ සිට ජනයාට උගන්වති"යි සැළ කළේය. දේව මාළිගාවේ සේනාධිපතියා සිය මුළු සේවකයන් සමග පිටත්ව ගොස් අපෝස්තුළුවරුන් රැගෙන ආවේය. එසේ ගෙනෙන විට සෙනඟ ඔවුන්ට ගල් ගසති යි යන බියෙන් අපෝස්තුළුවරුන්ට කිසි හිරිහැරයක් නොකළහ.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 34 : 1 – 8

පිළිතුර: සමිඳුනි, අසරණ අපට සවන් දුන මැනව. ආලේලූයා //

ගීය:

හැම වේලේම හිමිතුමන්ට මම ප්‍රශස්ති ගී ගයමි.
එතුමන්ගේ ගුණවැණුම් මා මුවෙන් තොර නොවෙයි.
මම එතුමන්ගේ ගුණ වර්ණනා කරමි. නිහතමානී අය ඒ අසා තොස් වෙත්වා.
මා සමඟ හිමිතුමන් වර්ණනා කරන්න. අපි එක් වී එතුමන්ගේ නාමය පසසමු.

මම හිමිතුමන් සොයා ගියෙමි. එතුමාණෝ මට පිළිතුරු දී හැම බියෙන් මා මිදූ සේක.
එතුමන් දෙස බලන්නා ප්‍රීතියෙන් බැබළෙන්නේය. ඔහුගේ මුහුණ කවදාවත් ලජ්ජාවෙන් අඳුරු නොවන්නේය.

හිමිතුමන්ට කන්නලව් කළ එක් අසරණයෙක් විය. එතුමාණෝ ඔහුගේ බස් අසා සියලු දුක් ගැහැටවලින් ඔහු මිදූ සේක. හිමිතුමන්ගේ දූතයා දේව බය ඇති අය වටකර, කඳවුරු බැඳ ඔවුන් මුදා හරියි.

හිමිතුමන් ගුණවත් බව ඔබ ම අත්දැකීමෙන් දැන ගන්න. එතුමන් කෙරේ විශ්වාසය තබන තැනැත්තේ ආසිරි ලබයි.

# සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"මාගේ බැටළුවෝ මාගේ කටහඬ අසති. මම ද ඔවුන් අඳුනමි.
ඔව්හු ද මා පසු පස්සේ එති"යි ස්වාමින් වහන්සේ වදාරණ සේක.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 3 : 16–21

**"දෙවියන් වහන්සේ ස්වකීය පුත්‍රයාණන් ලොවට එවා වදාළේ ලෝකය ගලවනු ලබන පිණිස ය."**

"දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත් ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් වුව ද ලෝකයට දෙවා වදාළ සේක. එසේ කළේ උන් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනාම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිස ය. දෙවියන් වහන්සේ ස්වකීය පුත්‍රයාණන් ලොවට එවා වදාළේ ලෝකයා විනිශ්චය කරන පිණිස නොව උන් වහන්සේ කරණකොටගෙන ලෝකය ගලවනු ලබන පිණිස ය. උන් වහන්සේ අදහා ගන්නා විනිශ්චය කරනු නොලැබේ. අදහා නොගන්නා දෙවියන් වහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන් අදහා නොගන්නා බැවින් දැනටම විනිශ්චය ලබා ඇත.

විනිශ්චය නම් මේ ය. ලෝකයට ආලෝකය පැමිණ තිබේ. එහෙත් තමන්ගේ ක්‍රියා නපුරු බැවින් මනුෂ්‍යයෝ ආලෝකයට වඩා අන්ධකාරයට ප්‍රිය කළහ. නපුරු ක්‍රියා කරන සැම දෙනම ආලෝකයට ද්වේශ කරති. ඔවුන්ගේ ක්‍රියා එළිවෙන බැවින් ඔව්හු ආලෝකයට නොපැමිණෙති. එහෙත් සත්‍ය දේ කරන තැනැත්තා තමන්ගේ ක්‍රියා දෙවියන් වහන්සේට කීකරු ව කරන ලද බව පෙනෙන පිණිස ආලෝකයට පැමිණේ ය"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.